සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# දේශපාලන විද්‍යාවේ මූලිකාංග - I

**13 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

උපදෙස් :- • ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

---

(01) දේශපාලන විද්‍යාව මගින් හදාරනු ලබන්නේ,

(1) සමස්ථ සමාජ ක්‍රමයේ ස්වභාවය පිළිබඳවය.
(2) ස්වභාවික විද්‍යාවන්ගේ ස්වභාවය හා ක්‍රියාකාරීත්වය පිළිබඳවය.
(3) මිනිසුන්ගේ සමාජ හැසිරීම පිළිබඳවය.
(4) මිනිස් සංහතියේ පරිණාමය පිළිබඳවය.
(5) දේශපාලන වශයෙන් මිනිසුන්ගේ හැසිරීම හා ක්‍රියාකාරකම් පිළිබඳවය. (......)

(02) දේශපාලන විද්‍යාව හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

A සමාජ විද්‍යාවක්ය.
B සමාජ විද්‍යවන් අතුරින් පැරණිම සමාජ විද්‍යාව වේ.
C විධිමත් ලෙස අධ්‍යයනය කිරීම ආරම්භ වූයේ ග්‍රීක යුගය තුළය.
D කාලීන විකාශය සමග විෂය පථය පුළුල් වී ඇත.
E මේ දක්වා යුග තුනක් හරහා විකාශනය වී ඇත.

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......)

(03) සමාජ විද්‍යාත්මක ක්‍රමයේ මූලිකාංග ඇතුළත් පිළිතුරු කාණ්ඩය තෝරන්න.

A සෘජු නිරීක්ෂණය.
B සම්මුඛ සාකච්ඡා.
C ප්‍රශ්ණාවලී
D කණ්ඩායම් ක්‍රියාකාරකම්.
E සිද්ධි අධ්‍යයනය.

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......)

(04) කාලීන විකාශනයත් සමග දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රයට එක් වූ නවාංග නිවැරදිව ඇතුලත් පිළිතුර තෝරන්න.

A නව ආණ්ඩුක්‍රම ආකෘතීන්.
B ආගමික මතිමතාන්තර.
C දේශපාලන බලය හා බලඅරගලය.
D රාජ්‍ය පාලනය සහ ප්‍රතිපත්ති සම්පාදනය.
E ගැටුම් කළමණාකරණය හා අන්තර්ජාතික දේශපාලනය.

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......)

(05) වැඩවසම් රාජ්‍ය ක්‍රමයේ මූලිකාංග දක්වෙන ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

A රාජාණ්ඩු පාලන ක්‍රමය.

B ප්‍රාදේශීය වශයෙන් බලය විසිරී පවතී.

C රදළවරුන්ගේ නායකත්වය.

D පාප් වහන්සේගේ ආධිපත්‍යය.

E ආණ්ඩුවේ බලතල විමධ්‍යගත වීම.

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......)

(06) ජාතික රාජ්‍ය බිහිවීම කෙරෙහි බලපෑ සාධකයක් නොවන්නේ,

(1) ධනවාදයේ බිහිවීම.

(2) රෝම අධිරාජ්‍ය අභාවයට යාමයි.

(3) වැඩවසම් වාදය බිඳවැටීමයි.

(4) පුනර්ජීවන විප්ලවයයි.

(5) ක්‍රිස්තියානි ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයයි. (......)

(07) සුභ සාධක රාජ්‍යය සම්බන්ධයෙන් අදාළ නොවන ප්‍රකාශය තෝරන්න.

(1) II වන ලෝක යුද්ධයෙන් පසු කාලය තුළ ඉදිරියට පැමිණියේය.

(2) කැනේඩියානු ආර්ථික දර්ශනය මගින් න්‍යායික පසුබිම ලැබුණි.

(3) සමාන පුරවැසියන් සහ සමාන ඉඩ ප්‍රස්ථාවන් යන සිද්ධාන්තය පදනම් විය.

(4) ආර්ථික කටයුතු වලට රාජ්‍ය මැදිහත් වීම අවම වීම.

(5) සමාජයේ පීඩාවට පත් වූ කොටස්වල භෞතික වර්ධනයට මැදිහත් වීම. (......)

(08) අවම රාජ්‍ය යනුවෙන් අදහස් කරනුයේ,

(1) මුලින්ම පාලනය නොකරන රාජ්‍යය.

(2) වැඩියෙන්ම පාලනය කරන රාජ්‍යය.

(3) ආර්ථිකය අවම මට්ටමකින් කළමනාකරණය කරන රාජ්‍යය.

(4) සමාජ සුභසාධනය සඳහා කැපවූ රාජ්‍යය.

(5) සමාජ ප්‍රජාතන්ත්‍රවාදී දර්ශනය පිළිගත් රාජ්‍යය. (......)

(09) ආණ්ඩුව හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ කණ්ඩය තෝරන්න.

A මිනිස් සමාජය පාලනය කරන ආයතනයකි.

B ස්වාධිපති බලය ක්‍රියාත්මක කරන ඒජන්තවරයාය.

C ජීවිතය හා මරණය පිළිබඳව නිත්‍යානුකූල බලය හිමි ආයතනයකි.

D පොලීසිය හා සිවිල් සේවය මගින් තම කාර්යයන් ක්‍රියාවට නංවයි.

E වෙනස්වීම් වලට යටත් නොවූ ආයතනයකි.

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......)

The National e-learning portal for the General Education

(10) රාජ්‍යය පිළිබඳ සමාජ විකාශනාත්මක න්‍යායට අදාළ ප්‍රකාශ කණ්ඩය තෝරන්න.

A සමාජ බැඳීම් මත සමාජ විකාශණය සිදු වී ඇත.

B රාජ්‍ය දීර්ග කාලීනව විකාශනයක ප්‍රතිඵලයකි.

C සමාජවාදී න්‍යායවාදීන් ඉදිරිපත් කර ඇත.

D පවුල නමැති ප්‍රාථමික ඒකකය රාජ්‍ය දක්වා විකාශණය වී ඇත.

E සංවිධානගත වීමේ ක්‍රියාදාමයේ උච්චතම අවස්ථාව රාජ්‍ය ලෙස සංවිධානය වීමයි.

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......)

(11) ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක මූලිකාංග දක්වෙන ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

A නීතියේ ආධිපත්‍යය.

B ව්‍යවස්ථානුකූලවාදය.

C නිදහස් හා සාධාරණ මැතිවරණ.

D ඒක පක්ෂ ක්‍රමය.

E නිදහස් ජන මාධ්‍යය

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......)

(12) රාජ්‍යය පිළිබඳ සමාජවාදී න්‍යායට අදාළ ප්‍රකාශ කාණ්ඩය තොරන්න.

A පූර්ව කොමියුනිස්ට් සමාජය තුළ රාජ්‍ය නොතිබිණි.

B රාජ්‍යය සදහටම පවතී.

C එය පංති පීඩක උපකරණයකි.

D පංති ප්‍රතිවිරුද්ධතා තිබෙනතාක් රාජ්‍යය පවතී.

E කොමියුනිස්ට් සමාජය තුළ රාජ්‍යය වියැකී යන්නේය.

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......)

(13) සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයේ ලක්ෂණයක් වන්නේ,

(1) ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන මූලධර්ම සහ සමාජවාදී ආර්ථික මූලධර්ම පදනම් කරගත් ක්‍රමයක් වීම.

(2) ආර්ථික ක්‍රියාවලියට රාජ්‍යය මැදිහත් නොවීමයි.

(3) පෞද්ගලික අංශයේ ක්‍රියාකාරීත්වය අනුක්‍රමයෙන් වැඩි කිරීමයි.

(4) ඒකාධිපති පාලන ක්‍රමයක් ගොඩනැගීම අවසාන ඉලක්කය වීමයි.

(5) විවෘත වෙළඳ පොළ ක්‍රමයෙන් ක්‍රියාත්මක වීම. (......)

(14) පහත සඳහන් කරුණු අතරින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක ඇතුලත් නොකළ යුත්තේ,

(1) ආණ්ඩුවේ ත්‍රිවිධ ආයතන අතර බලය බෙදීමයි.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ කාර්යය පටිපාටියයි.

(3) පරිපාලන නිලධාරීන් බඳවාගැනීමේ කාර්යය පටිපාටියයි.

(4) නියෝජන ක්‍රමයයි.

(5) මූලික අයිතිවාසිකම් ප්‍රකාශනයයි. (......)

(15) අනම්‍ය ව්‍යවස්ථාවකට වඩාත් ගැලපෙන ප්‍රකාශය තෝරන්න.

(1) ව්‍යවස්ථාව සරල බහුතරයකින් වෙනස් කළ හැකියි.
(2) ව්‍යවස්ථාව අනිවාර්යයෙන්ම ලිඛිත විය යුතුයි.
(3) ව්‍යවස්ථාව සංශෝධනය කළ හැක්කේ පූර්ව අධිකරණ අනුමැතියකින් පසුවය.
(4) ව්‍යවස්ථාව වෙනස් කිරීම සඳහා විශේෂ ක්‍රියාමාර්ගයක් අනුගමනය කළ යුතුය.
(5) ව්‍යවස්ථාව වෙනස් කළ හැක්කේ ජනමත විචාරණයකින් පසුවය. (......)

- **පහත තොරතුරු අදාළ කරගනිමින් අංක 16 හා 17 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(A) විවිධත්වය තුළින් ඒකීයත්වය කරා පැමිණීම.
(B) මට්ටම් දෙකක ආණ්ඩුව පැවතීම.
(C) එක් කේන්ද්‍රයික සියලු බලතල ඒකරාශී වීම.
(D) බහුවිධ සමාජවලට වඩා සුදුසු වීම.
(E) පුරවැසියන් ආණ්ඩු දෙකකට යටත් වීම.
(F) ස්වාධිපති බලය බෙදී නොතිබීම.
(G) තනි පරිපාලන සහ අධිකරණ ක්‍රමයක් පැවතීම.
(H) බලය කාර්යක්ෂම ලෙස ක්‍රියාවට නැංවිය හැකි වීම.

(16) ස්වාධීන ක්‍රමයට අදාළ ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

(1) ABDE (2) ACDE (3) BDFG (4) CFGE (5) EFGH (......)

(17) ඒකීය ක්‍රමයට අදාළ ප්‍රකාශ කාණ්ඩය තෝරන්න,

(1) ABCD (2) ACDE (3) CFGH (4) ADCF (5) EFGH (......)

(18) බලපෑම් කණ්ඩායම් පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය කුමක්ද ?

(1) පොදු සමාජ අභිලාශයන් ඒකරාශී කිරීම මූලික අරමුණ වේ.
(2) පුද්ගල අභිලාශයන් වෙනුවෙන් සංවිධානය වී ඇත.
(3) බලපෑම් ක්‍රියාකාරීත්වය ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන වර්ධනයේ දර්ශනයක් වේ.
(4) රාජ්‍ය බලය ලබාගැනීම අරමුණුකර නැත.
(5) ප්‍රතිපත්ති සම්පාදනයක දී ආණ්ඩුට බලපෑමක් කරයි. (......)

(19) දේශපාලන පක්ෂවල කාර්යවලට අදාළ ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

A රාජ්‍ය බලය අල්ලාගැනීම සඳහා සටන් වැදීම.
B විසිරී ඇති මහජන මතය ඒකරාශී කිරීම.
C සමාජ බලය අධිකාරි බලය බවට පරිවර්තනය කිරීම.
D ඡන්දදායකයින් දැනුවත් කිරීම.
E ප්‍රතිපත්ති සම්පාදනයට සෘජුවම සහභාගි වීම.

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......)

The National e-Learning Portal for The General Education

- **නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.**

(20) යහපාලනයේ මූලිකාංග ඇතුලත් කාණ්ඩය තෝරන්න.

A පාරදෘෂ්‍යභාවය.
B අධිපාලනය.
C වගකීම.
D සමාජ විගමනය.
E නීතියේ ආධිපත්‍යය.

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......)

(21) අයිතිවාසිකම් වලට අදාළ ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

A පෞරුෂත්වය වර්ධනය කරගැනීමට අත්‍යවශ්‍ය වේ.
B සිවිල් හා දේශපාලන වශයෙන් කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය.
C සංවිධාන සමාජය තුළ පමණක් භුක්ති විඳිය හැකිය.
D යුතුකම්වලින් බැහැරව පවතී.
E සමහර අයිතිවාසිකම් රාජ්‍ය නීතිය අනුව සුරක්ෂිත කර ඇත.

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......)

(22) රාජ්‍ය ප්‍රතිපත්ති නිර්මාණය සම්බන්ධ වඩාත් නිවැරදි පිළිතුර තෝරා ලියන්න.

(1) රාජ්‍යයේ මාර්ග සිතියම රාජ්‍ය ප්‍රතිපත්තිය වේ.
(2) රාජ්‍යයේ නෛතික හා අධිකාරීමය පදනම නිරූපණය කරයි.
(3) පොදු යහපත ඉලක්ක කර ගනී.
(4) රජයේ මූලධාර්මික පදනම් ප්‍රදර්ශනය කරයි.
(5) රටක දේශපාලනික පක්ෂවල දැක්ම තීරණය කරයි. (......)

(23) රජයේ පාලනයේ විෂය ක්ෂේත්‍රවලට අයත් මාතෘකාවක් නොවන්නේ,

(1) රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයයි.
(2) සේවකයන් බඳවාගැනීමයි.
(3) නීති සම්පාදනයයි.
(4) මූල්‍ය කළමනාකරණයයි.
(5) මානව සම්පත් කළමනාකරණයයි. (......)

(24) අන්තර්ජාතික දේශපාලනයේ ප්‍රධාන රඟුම්කරුවන් ඇතුලත් කාණ්ඩය තෝරන්න.

A නිදහස් ස්වාධිපති ජාතික රාජ්‍යයන්.
B බහුජාතික සමාගම්.
C අන්තර්ජාතික සංවිධාන.
D රාජ්‍ය නොවන සංවිධාන.
E පුද්ගලයින්.

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......)

(25) ගැටුම් නිරාකරණය කිරීමේ මූලික පරමාර්ථය වන්නේ,

(1) එක් පාර්ශවයකට ජය ලැබීමයි.
(2) පාර්ශව දෙකටම එය ලැබීමයි.
(3) පාර්ශව දෙකටම පරාජය ලැබීමයි.
(4) එක් පාර්ශවයකට වැඩි ජයක් ලැබීමයි.
(5) ගැටුම්කාරී පාර්ශව අධිකරණය හමුවට පැමිණවීමයි. (......)

(26) ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරයට අදාළ ප්‍රකාශ කාණ්ඩය තෝරා ලියන්න.

A ආගමික පුනර්ජීවන ව්‍යාපාරය මගින් ආරම්භක පදනම දමන ලදී.
B ලංකා ප්‍රතිසංස්කරණ සංගමයේ තවත් ඉදිරි පියවරක් විය.
C නිල ආරම්භය ජාතික සංගමය පිහිටුවීම සමග ඇති විය.
D අභ්‍යන්තර ස්වයං පාලනය දිනාගැනීම එක් අරමුණක් විය.
E ඉන්දියානු ජාතික ව්‍යාපාරයට බෙහෙවින් සමාන විය.

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......)

(27) වාමාංශික ව්‍යාපාරය සම්බන්ධයෙන් අදාළ වන ප්‍රකාශ කාණ්ඩ මොනවාද?

A ලංකා සමසමාජ පක්ෂය පිහිටුවීමෙන් සංවිධානාත්මක ආරම්භය විය.
B දේශපාලන ශක්තිය රඳාපැවතියේ නාගරික කම්කරු පන්තිය මතය.
C නායකත්වය උසුලන ලද්දේ රැඩිකල් මධ්‍යම පාන්තික බුද්ධිමතුන් විසිනි.
D ප්‍රධාන අරමුණක් වූයේ සමාජවාදී සමාජයක් ගොඩනැගීමයි.
E අභ්‍යයන්තර ස්වයං පාලනය සඳහා උද්ඝෝෂණ කරන ලදී.

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......)

- **අදාළ නොවන ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.**

(28) 1833 කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ වලට අදාළ විධායක සභාව,

(1) සමන්විත වූයේ සාමාජිකයින් හය දෙනෙකුගෙන්.
(2) සියලු සාමාජිකයින් නිල බලයෙන් පත් විය.
(3) ආණ්ඩුකරුගේ නායකත්වයෙන් පත් විය.
(4) ආණ්ඩුකරුට සහයවීමේ උපදේශක සභාවක් විය.
(5) විසුරුවා හැරීමේ බලය ආණ්ඩුකරු සතුවිය. (......)

(29) ඩොනමෝර් ව්‍යවස්ථාව යටතේ ආණ්ඩුකරුට නිශේධ බලය යොදිය හැකි පනත් දැක්වෙන පිළිතුර තෝරන්න.

A රාජ්‍ය සේවය හා සම්බන්ධ පනත්.
B අභ්‍යන්තර වෙළඳාම සම්බන්ධ පනත්.
C රාජ්‍ය ආරක්ෂාවට බලපාන පනත්.
D රටේ මූල්‍ය තත්වයට බලපාන පනත්.
E අධිකරණය හා සම්බන්ධ පනත්.

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......)

(30) සොල්බරි ව්‍යවස්ථාව අනුව ව්‍යවස්ථාදායකයට අදාළ ප්‍රකාශ කාණ්ඩය නොවන්නේ,

A ද්විමාණ්ඩලික වීම.
B නාමකරණයෙන් හා ජනතා ඡන්දයෙන් නියෝජිතයන් පත් වීම.
C ව්‍යවස්ථා සම්පාදන බලය සීමා වීම.
D පාර්ලිමේන්තුව යන නිල නාමයෙන් හැඳින්වීම.
E මණ්ඩල දෙකේ නිල කාලය සමාන වීම.

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......)

(31) සොල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අගමැති සම්බන්ධයෙන් ගැලපෙන ප්‍රධාන කාණ්ඩ තෝරන්න.

A අග්‍රාණ්ඩුකාරවරයා විසින් පත් කරන ලදී.

B රාජ්‍ය නායකයා විය.

C ව්‍යවස්ථාදායකයට වගකිව යුතු විය.

D කැබිනට් මණ්ඩලය පත්කිරීමේ පූර්ණ බලය ඉසිලීම.

E ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශය භාරව ක්‍රියා කරන ලදී.

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......)

(32) සොල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් අදාළ නොවන ප්‍රකාශය කුමක්ද?

(1) පාර්ලිමේන්තු ක්‍රමය හඳුන්වාදෙනු ලැබේ.

(2) සුළු ජන කොටස්වලට විශේෂ රැකවරණය ලබාදෙන ලදී.

(3) ගොඩනැගූ ව්‍යවස්ථාදායකය ද්වි මාණ්ඩලික විය.

(4) ලංකාවට පූර්ණ නිදහස ප්‍රදානය කරන ලදී.

(5) විධායකය සම්පූර්ණයෙන් ව්‍යවස්ථාදායකයෙන් වෙන් නොකරන ලදී. (......)

(33) පළමු ජනරජ ව්‍යවස්ථාවට අනුව ව්‍යවස්ථාදායකය,

A ඒක මාණ්ඩලික වීම.

B නීති සම්පාදන බලය උත්තරීතර විය.

C ජාතික රාජ්‍ය සභාව නම් විය.

D වසර 6 ක නිල කාලයකින් සමන්විත විය.

E සාමාජිකයින් 196 කින් සමන්විත විය.

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......)

(34) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය,

A විනිසුරුවරුන් පස් දෙනකුගෙන් සමන්විත විය.

B ව්‍යවස්ථා විවරණ බලය හිමි නොවීම.

C පනත් කෙටුම්පත් වල ව්‍යවස්ථානුකූලභාවය පිරික්සනු ලැබීම.

D තීන්දු ගනු ලැබුවේ බහුතර විනිසුරුවරුන්ගේ එකඟතාවයෙනි.

E සෑම තීන්දුවක්ම පැය 24 ක් තුළ ලබා දිය යුතුය

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......)

(35) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අගමැති

A ව්‍යවස්ථාදායකයේ ප්‍රධානියා වේ.

B නාමික විධායක විසින් පත්කරනු ලබයි.

C ජාතික රාජ්‍ය සභාවට වගනොකියන ලදී.

D කැබිනට් මණ්ඩලය තෝරා පත්කරනු ලැබීය.

E ජාතික රාජ්‍ය සභාවේ බහුතරයේ විශ්වාසය දිනාගත් පුද්ගලයා විය.

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......)

The National e-Learning Portal for The General Education

(36) දෙවන ජනරජ ව්‍යවස්ථාවට අනුව ව්‍යවස්ථාදායකය,

A ඒක මාණ්ඩලික විය.

B නිල කාලය වසර 5 කි. (06)

C සාමාජික සංඛ්‍යාව 225 කි.

D විසුරුවා හැරීමේ බලය ජනාධිපති සතු වේ.

E නීති පැනවීම සම්බන්ධයෙන් පූර්ණ ස්වාධිපතිබලය භුක්ති නොවිඳියි.

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......)

(37) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයා,

A සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකයා වේ.

B කැබිනට් මණ්ඩල ප්‍රධානියා වේ.

C ව්‍යවස්ථාවට අනුකූලව පාර්ලිමේන්තුවට වගකීමට බැඳී සිටී.

D අගමැති ඇතුළු ඇමති මණ්ඩලය පත්කරයි.

E පාර්ලිමේන්තු ලේකම්වරයා පත්කරයි.

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......)

- **නිවැරදි ප්‍රකාශය ඇතුළත් කාණ්ඩය තෝරන්න.**

(38) 1978 ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය,

A මූලික නිතීයේ බලය ලබාගනී.

B අගවිනිසුරු හා 06 කට නොඅඩු සහ 10 කට නොවැඩි විනිසුරුවරුන් ගණනකින් සමන්විතය.

C පාර්ලිමේන්තු මැතිවරණ පෙත්සම විභාග කිරීමේ බලය ඇත.

D අවසාන අභියාචනාධිකරණ බලය හිමි ආයතනය වේ.

E උපදේශක අධිකරණ බලය භුක්ති විඳියි.

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......)

(39) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය සේවකයින් පත් කිරීම සහ මාරු කිරීම පිළිබඳව බලය හිමි ආයතනය වන්නේ.

(1) රාජ්‍ය සේවා උපදේශක මණ්ඩලයයි.

(2) රාජ්‍ය සේවා විනය මණ්ඩලයයි.

(3) රාජ්‍ය සේවා කොමිෂන් සභාවයි.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයයි.

(5) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවයි. (......)

(40) 1978 හඳුන්වා දුන් නියෝජන ක්‍රමයට ආදාළ ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

A මන්ත්‍රීවරයා හා ජනතාව අතර කිට්ටු සම්බන්ධතාවක් ගොඩ නැගේ.

B සුළු පක්ෂවලට ව්‍යවස්ථාදායකය තුළ වැඩි අවස්ථාවක් හිමි වේ.

C බහුමන්ත්‍රී ආසන ක්‍රමය නිසා මහජන ප්‍රතිචාර පුළුල්ව නියෝජනය වේ.

D ප්‍රබල ආණ්ඩු පක්ෂ හා ප්‍රබල විපක්ෂයක් ගොඩනැගීමට බාධා වේ.

E අතුරු මැතිවරණ නොපැවැත්වීම නිසා කාලය හා ධනය ඉතිරි වේ.

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......)

(41) පළාත් සභා ක්‍රමයට අදාළ නොවන ප්‍රකාශය තෝරන්න.

(1) 13 වෙනි ව්‍යවස්ථා සංශෝධනය මගින් පිහිටුවන ලදී.
(2) 1987 ඉන්දුලංකා ගිවිසුමේ එකඟත්වයන්ට අනුව පිහිටුවන ලදී.
(3) ශ්‍රී ලංකාවේ ජනවාර්ගික අර්බුදයට එක් විසඳුමක් ලෙස පිහිටුවන ලදී.
(4) එක් පළාතකට එක බැගින් පිහිටුවා ඇත.
(5) පළාත් මහා ඇමතිවරයා විසින් ආණ්ඩුකාරවරයා පත්කරයි. (......)

(42) 17 වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත කළ යුතු පත්කිරීම් ඇතුලත් කාණ්ඩය තෝරන්න.

A නීතිපතිවරයා.
B පොලිස්පතිවරයා.
C අමාත්‍යාංශ ලේකම්වරු.
D විගණකාධිපතිවරයා.
E පාර්ලිමේන්තු මහ ලේකම්වරයා.

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......)

(43) අන්තර්ජාතික දේශපාලන ක්ෂේත්‍රය තුළ ජාත්‍යන්තර සංවිධාන වර්ධනය වීම කෙරෙහි බලපෑ හේතු සාධක වන්නේ,

A සන්නිවේදන හා ප්‍රවාහන ක්ෂේත්‍රය තුළ ඇති වූ සීඝ්‍ර වර්ධනය.
B තම ගැටළු හා අර්බුද තනිව විසඳා ගැනීමට නොහැකි වීම.
C තිරසාර සාමයක් ස්ථාපිත කිරීම අත්‍යාවශ්‍ය බව ලෝකය තේරුම් ගැනීම.
D සාමකාමී ආකාරයෙන් අර්බුද නිරාකරණය කරගැනීම වඩා යෝග්‍ය වීම.
E පුනුරුද ව්‍යාපෘතියේ බලපෑම.

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......)

(44) පළාත් ආණ්ඩුකාරවරයා,

A මධ්‍යම ආණ්ඩුවේ නියෝජිතයා වේ.
B පස් අවුරුදු නිල කාලයට පත් වේ.
C නාමික විධායකයා වේ.
D පළාත් මහාධිකරණයට විනිසුරුවන් පත්කරනු ලැබේ.
E පළාත් සභාවට වගකීමට බැඳී නැත.

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......)

(45) වර්තමාන පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් අදාළ ප්‍රකාශ කණ්ඩය තෝරන්න.

A මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභාවලින් සමන්විත වේ.
B සභිකයන් තෝරාපත්කර ගන්නේ සමානුපාතික නියෝජන ක්‍රමයෙනි.
C පළාත් පාලන අමාත්‍යාංශයේ අධීක්ෂණයට යටත් වේ.
D තම බල ප්‍රදේශයට බලපාන පරිදි ප්‍රඥප්ති සම්පාදනය කරගත හැක.
E අරමුදල් සම්පාදනය කරන්නේ බදු මුදල් වලින් පමණි.

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......)

(46) වර්තමාන ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය,

A දිගුකාලීන ඉතිහාසයකට සම්බන්ධ වේ.

B බහු පක්ෂ ක්‍රමයක් කරා ගමන් කෙරේ.

C සමහර පක්ෂ වාර්ගික, ආගමික පදනමින් සංවිධානය වී ඇත.

D වාමාංශික පක්ෂවල බලය හීන වී ඇත.

E සභාය ආණ්ඩුක්‍රම පිහිටුවීමට වැඩි නැඹුරුවක් දක්වයි.

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......)

(47) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන පරමාර්ථ ඇතුලත් කාණ්ඩ තෝරන්න.

A ලෝක සාමය පවත්වාගෙන යාම.

B ගැටුම් සාමකාමීව නිරාකරණය කරගැනීම.

C ජාතීන් අතර මිත්‍රත්වය වර්ධනය කිරීම.

D දරිද්‍රතාව පිටුදැකීම.

E මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......)

(48) රටක විදේශ ප්‍රතිපත්තියේ අරමුණක් නොවන්නේ,

(1) ජාතික පැවැත්ම තහවුරු කරගැනීම.

(2) වෙළඳාම වර්ධනය කරගැනීම.

(3) විදේශ ආධාර ලබාගැනීම.

(4) රටක සමාජ සුභසාධනය ඉහළ නැංවීම

(5) රටේ අභිමානය වර්ධනය කර නොගැනීම. (......)

(49) රාජ්‍ය නොවන සංවිධාන ගණයට අයත් නොවන සංවිධානය කුමක්ද ?

(1) අන්තර්ජාතික රතු කුරුස සමාජය.

(2) ජාත්‍යන්තර ක්ෂමා ආයතනය.

(3) මානව හිමිකම් විමර්ශන සංවිධානය.

(4) යුරෝපා පොදු ආර්ථික හවුල.

(5) පැපරල් සංවිධානය. (......)

(50) වර්තමානයේ සාර්ක් කලාපීය රටවල් පොදුවේ මුහුණ පා ඇති ගැටළු හා අන්තර්ගත ප්‍රකාශ කාණ්ඩ තෝරන්න.

A ත්‍රස්තවාදය.

B අවි වෙළදාම.

C වාර්ගික ගැටුම්

D දරිද්‍රතාව.

E මත්ද්‍රව්‍ය උවදුර.

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......)

(2 x 50 = 100)

The National e-Learning Portal for The General Education

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## දේශපාලන විද්‍යාවේ මූලිකාංග - II

13 ශ්‍රේණිය

කාලය පැය 03 යි.

සැලකිය යුතුයි :-

- මෙම ප්‍රශ්න පත්‍රය **A, B, C** යනුවෙන් කොටස් තුනකි.
- **A** කොටස සඳහා කෙටි පිළිතුරු සපයන්න. එක් පිළිතුරකට ලකුණු 01 කි.

---

## A කොටස

(01) දේශපාලන විද්‍යාව සමාජ විද්‍යාවක් ලෙස සැලකේ. මෙම ප්‍රකාශය තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කර ඇති තර්ක 02 ක් නම් කරන්න.

(02) මිනිසාගේ දේශපාලන හැසිරීම කෙරෙහි බලපාන සාධක 02 ක් නම් කරන්න.

(03) දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීමේ ප්‍රවේශ දෙකක මූලික ලක්ෂණ දෙකක් පහත දක්වේ. එම එක් එක් ලක්ෂණයට අදාළ අධ්‍යයන ක්‍රමය ඉදිරියෙන් ලියා දක්වන්න.

1. විද්‍යාත්මක ශිල්පක්‍රම භාවිතය
2. අභ්‍යුපගමනය මත ගොඩනැගී තිබීම

(04) දේශපාලන විද්‍යාව නියම විද්‍යාවක් ලෙස සැලකිය නොහැකි බවට ඉදිරිපත් වී ඇති තර්ක දෙකක් දක්වන්න.

(05) ග්‍රීක නාගරික රාජ්‍ය ක්‍රමයේ ලක්ෂණ 02 ක් නම් කරන්න.

(06) මධ්‍යයතන යුගයේ පැවති රාජ්‍ය ක්‍රමයේ ලක්ෂණ 02 ක් නම් කරන්න.

(07) ජාතික රාජ්‍ය බිහිවීමට තුඩුදුන් හේතු 02 ක් ලියන්න.

(08) නිර්බාධවාදී රාජ්‍ය ක්‍රමයේ මූලික මූලික ලක්ෂණ දෙකක් ලියන්න.

(09) සුබසාධනවාදී රාංජ්‍ය ක්‍රමය බිහිවීමට බලපෑ හේතු දෙකක් ලියන්න.

(10) විකාශනාත්මකවාදීන් දක්වූ ආකාරයට මිනිසුන් එකට එක්තැන් වීම කෙරෙහි බලපෑ සමාජ බන්ධන දෙකක් ලියන්න.

(11) කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ යෝජනා දෙකක් ලියන්න.

(12) 1931 සර්වජන ඡන්දබලය ප්‍රධානය කිරීමට බලපෑ හේතු දෙකක් ලියන්න.

(13) 1947 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ ගොඩනැගූ ව්‍යවස්ථාදායකය ද්විමාණ්ඩලික විය. එම මණ්ඩල දෙක නම්කරන්න.

(14) සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යොදා තිබූ විධි විධාන දෙකක් නම් කරන්න.

(15) 1972 ව්‍යවස්ථාවෙන් හඳුන්වාදුන් නවාංග දෙකක් නම් කරන්න.

(16) 1978 ව්‍යවස්ථාව යටතේ මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා ගොඩනඟා ඇති යාන්ත්‍රණයේ අන්තර්ගත ආයතන දෙකක් නම්කරන්න.

(17) ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ මූලික ලක්ෂණ දෙකක් නම්කරන්න.

(18) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බලපෑම් කණ්ඩායම් දෙකක් නම් කරන්න.

(19) එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවීමේ අරමුණු දෙකක් නම් කරන්න.

(20) සාර්ක් සංවිධාන ව්‍යුහයේ ඉහළම ආයතන දෙක නම් කරන්න. (1 x 20 = 20)

## B කොටස

(01) (1) දේශපාලන විද්‍යාවේ සමාජ විද්‍යාත්මක ස්වභාවය පැහැදිලි කරන්න.

(2) දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීමේ වැදගත්කම පහදා දෙන්න.

(3) දේශපාලන විද්‍යාව අධ්‍යයනය සඳහා දාර්ශනික හා තුලනාත්මක අධ්‍යයනය ක්‍රමයන්හි වාසි අවාසි පෙන්වා දෙන්න.

(4) දේශපාලන විද්‍යාව හා දේශපාලනය අතර වෙනස පැහැදිලි කරන්න.

(02) ලිබරල් වාදය සහ සමාජවාදය යටතේ පහත දැක්වෙන මාතෘකා සසඳන්න.

(1) රාජ්‍යය ආරම්භය

(2) රාජ්‍යයේ කාර්යභාරය

(3) රාජ්‍යයේ විකාශනය

(4) රාජ්‍යයේ අනාගතය

(03) පහත දැක්වෙන මාතෘකා විමසන්න.

(1) ඇමරිකානු ෆෙඩරල් ක්‍රමයේ මූලික ලක්ෂණ

(2) ඉන්දියානු ෆෙඩරල් ක්‍රමයේ මූලික ලක්ෂණ

(3) ස්විට්සර්ලන්ත ෆෙඩරල් ක්‍රමයේ මූලික ලක්ෂණ

(4) ෆෙඩරල් ආණ්ඩුක්‍රමයේ වාසි අවාසි.

(04) පහත දැක්වෙන ඒවා විභාග කරන්න.

(1) රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය.

(2) අන්තර්ජාතික දේශපාලනයේ ස්වභාවය.

(3) ගැටුම් කළමණාකරන විධි ක්‍රම.

(4) දේශපාලන සමාජානුයෝජනය.

## C කොටස

(05) කෝල්බෲක්කැමරන් ප්‍රතිසංස්කරණය මඟින් ශ්‍රී ලංකාව තුළ පහත දැක්වෙන ක්ෂේත්‍ර ආශ්‍රිතව සිදු වූ වෙනස්කම් සාකච්ඡා කරන්න.

(1) ආර්ථික (2) සමාජයීය (3) දේශපාලන (4) අධිකරණ

(06) ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය හා සම්බන්ධව පහත දැක්වෙන ඒවා විමසන්න.

(1) ආරම්භය

(2) නායකත්වයේ සවභාවය.

(3) අරමුණු.

(4) අරමුණු දිනාගැනීම ක්‍රියාත්මක වූ ආකාරය.

(07) ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යටතේ පහත සඳහන් මාතෘකා විභාග කරන්න.

(1) සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීම.

(2) වාර්ගික නියෝජනය අහෝසි කිරීම.

(3) විධායක කාරක සභා පිහිටුවීම.

(4) අමාත්‍ය මණ්ඩලය.

(08) 1972 සහ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ආශ්‍රයෙන් පහත සඳහන් මාතෘකා විභාග කරන්න.

(1) විධායක බලතල ක්‍රියාවට නැංවීම.

(2) ව්‍යවස්ථාදායක බලතල.

(3) ව්‍යවස්ථා අණපනත් විනිශ්චය කිරීම.

(4) රාජ්‍ය සේවය.

(2 x 40 = 80)

The National e-learning Portal for The General Education